**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරීම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යන සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන වූ එජඩො මිලියන 183.90 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 2,840 ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කරන දිනය 2022 මාර්තු 31 දක්වා හා 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ වගුව 2 හි විස්තර වන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල<br>රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඡේද අංක 38 ප්‍රකාරව රු.මිලියන 49.06 ක්වූ ව්‍යාපෘති ප්‍රජා දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෙළිදරව් කර නොතිබුණි. | 49.06 | අපි 2022 දී ප්‍රජා දායකත්වය ගණනය කර ප්‍රාග්ධනිත කරන්නෙමු. තවද, සමහර ව්‍යාපෘති ප්‍රාග්ධනිත කර නොතිබූ අතර එබැවින් ප්‍රජා දායකත්වය ගණනය කර නොතිබුණි. | අවසන් කරන ලද ව්‍යාපෘතීන් සඳහා ප්‍රජා දායකත්වය හඳුනාගත යුතු වීම. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. මිලියන 877.16ක ණය පොලිය සහ රු.මිලියන 539.56ක සේවා ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 1,416.72 | මෙම ප්‍රතිපත්තිය 2018 වර්ෂයේ සිට භාණ්ඩාගාරය විසින් අත්හිටුවා ඇති අතර එය අපගේ භාණ්ඩාගාර වැය වාර්තාවල ද නොපෙන්වයි. | 2013 නොවැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 හි විධිවිධානවලට අනුකූල වීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) | මණ්ඩලය විසින් ව්‍යාපෘති කටයුතු සඳහා නිදහස් කරන ලද සේවකයින් සඳහා රු.මිලියන 60.3 ක් ප්‍රතිපූරණය කල යුතු වේ. කෙසේ වෙතත්, රු. මිලියන 30.5 ක් පමණක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවිය යුතු බවට හඳුනාගෙන තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් රු.**මිලියන** 29.8 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 29.8 | 2021 වර්ෂය තුළ අපි මාස කිහිපයක් සඳහා මණ්ඩලයේ සේවකයින්ගේ වැටුප් ප්‍රතිපූරණය කර ඇත. අපි දැනටමත් 2021 හි ඉතිරි වියදම් උපචිත කර ඇත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියට මුදා හරින සේවකයින් සඳහා ගෙවනු ලබන වැටුප් ව්‍යාපෘතියේ ගිණුම් පොත්වල නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ඈ) | පසුගිය වර්ෂයන් තුළ නිම කොට ජනතා අයිතියට පත් කරන ලද වටිනාකම රු.මිලියන 21.3 ක් වන ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතීන් දෙකක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාග්ධනිත ගත කර නොතිබුණි. | 21.3 | අවසන් බිල්පත ඉදිරිපත් නොවීය.මෙම කාරණාව හේතුවෙන් එය ප්‍රාග්ධනිත ගත කර නැත. | නිම කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති වටිනාකම ප්‍රාග්ධනිත ගත කළ යුතු වීම. |

### 2.2 නොපියවූ ශේෂයන්

| අංකය | විස්තරය | මුදල | නොපියවූ කාල සීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | | |
| (අ) | කොන්ත්‍රාත් රඳවා ගැනීම් | 283.64 | වසර 3 වැඩි | සමහර ව්‍යාපෘතිවල රඳවා ගැනීම් නිදහස් කර ඇති අතර අනෙක් ඒවා මෙම වසර තුළ නිදහස් කෙරේ. | දෝෂ සහිත වගකීම් කාලයෙන් පසු කොන්ත්‍රාත් රඳවා ගැනීම් පියවීමට ක්‍රියා කළ යුතුවීම. |
| (ඇ) | බාහිර ආයතන වල තබා ඇති කෙටි කාලීන තැන්පත් | 88.81 | වසර 3 වැඩි | ව්‍යාපෘතිය අවසන් වුවද, අපට එම තැන්පතු සඳහා හිමිකම් කිව හැක්කේ වසර 2කට පසුවය. | කෙටිකාලීන තැන්පත් ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වීම. |

### 2.3 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) 170 (3) රෙගුලාසිය | සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුගෙන් අඩු කර ගන්නා ලද රු.මිලියන 8.45 ක ඇවර කිරීමේ අලාභ 2022 මැයි 31 දින වන වටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | අවසන් ගෙවීම සිදු කල පසු එය රාජ්‍ය ආදායමට යවනු ලැබේ. | මුදල් රෙගුලාසිවල ප්‍රතිපාදනයන්ට අනුගත විය යුතු වීම. |
| (ii) රෙගුලාසි 245 සහ 257 | නියැදි විගණන පරීක්ෂාවට අනුව, සහතික කිරීමකින් තොරව ගෙවීම් වවුචර් 23ක් සඳහා රු.මිලියන 178.5කට සමාන මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | අපි එය පිළිගෙන නිවැරදි කරන්නෙමු. | මූල්‍ය රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාද දින ගණන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කර ගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | | |
| **නාගරික, ග්‍රාමීය සහ වතු පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමේ ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් යෝජනා ක්‍රම** | **නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම** | | | | | |
| | පඹගින්න ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 82 | 854 | 2022 අගෝස්තු මාසයේදී සම්පූර්ණ වැඩ නිම කිරීමට බලාපොරොත්තු වේ. | (අ සිට ම දක්වා) i) දී ඇති ඉලක්කගත දිනයන් තුළ කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට කළමනාකාරීත්වය පියවර ගත යුතු වීම. ii) කොන්ත්‍රාත්කරුවන්ගේ පිළිගත නොහැකි හේතූන් සඳහා කාල දිගුවන් ලබා නොදිය යුතු වීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනයන් |
| | මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 90 | 693 | නිම කිරීමට තවත් මාස තුනක කාලයක් අවශ්‍ය වේ. | |
| | **පුනරුත්ථාපන හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම** | | | | | |
| | ඔරුබැඳිවැව ජල සම්පාදන යෝජනා ක්‍රමය (අදියර 1) | 100 | 92 | 592 | එය සම්පූර්ණ කර ඇති අතර තුළමුව පොම්පය ස්ථාපනය කිරීමෙන් පසු ඉක්මනින් ආරම්භ කළ යුතු වේ. | |
| | දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 31 | 935 | අවසන් කරන ලදී. කාර්ය සාධන බැඳුම්කරය අහිමි කොට අත්තිකාරම් ආපසු අයකර ගනු ලැබේ. | |
| | ඔරුබැඳිවැව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (අදියර ii) | 100 | 95 | 480 | සෝදා හැරීමෙන් පසු සම්බන්ධතා ලබා දීම ආරම්භ වේ. ජලය ලැබීමට නියමිතය. මෙම කාර්යය ජූලි මස අවසානයේ ආරම්භ කළ හැකි වේ. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| යටි ඇල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 277 | භෞතික කාර්ය සාධනය 75% කි. | පවතින අවස්ථාවන්හිදී කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අඩු කර ගත යුතු වීම. |
| වැලිගපොල ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 75 | 228 | කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය, රටේ වත්මන් තත්ත්වය හේතුවෙන් වන ඉන්ධන සහ ද්‍රව්‍ය හිඟය නිසා ප්‍රමාදයක් පවතී. | iii) දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් ප්‍රදානය නොකල යුතු වීම. |
| බුලුවාන ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 88 | 511 | නිවාස සම්බන්ධතා ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක මට්ටමේ පවතී. පිරිපහදු මධ්‍යස්ථානය ක්‍රියාත්මක කොට කර ඇත. | |
| දොඹගම්මන ග්‍රාමීය ජල සම්පාදන ඉදි කිරීම් යෝජනා ක්‍රමය | 100 | 97 | 574 | මහජන විරෝධතා හේතුවෙන් ප්‍රමාද වී ඇත. | iv) අහෝසි කරන ලද කොන්ත්‍රාත්තු සඳහා හැකි ඉක්මනින් නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කල යුතු වීම. |
| සංගිලිපාලම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 65 | 360 | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇත. | |
| හෝප් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 337 | පාරිභෝගිකයන්ගේ විරෝධය නිසා වැඩ ප්‍රගතිය ප්‍රමාද විය. | |
| බුලත්කොහුපිටිය ඒකාබද්ධ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 80 | 499 | සම්බන්ධතා වැඩසටහන 2022 ජූලි මස අවසානයේ ආරම්භ කෙරේ. මාස තුනකින් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | |
| පීල්ලෙකඳුර ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 75 | 1463 | ජනසතු කර ඇත. පිරිපහදු මධ්‍යස්ථානය අවසන් කොට ඇත.ප්‍රගතිය 80% කි. | |

| | | | | |
|---|---|---|---|---|
| තණ්ඩුවාන් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 75 | 358 | විදුලිය සැපයීමේ සුළු ප්‍රමාදයක් පවතී. නිවාස සම්බන්ධතා ලබා දීමේ වැඩසටහන තවත් මාස 3කින් අවසන් කෙරේ. |
| කල්මඩුනගර් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 80 | 1058 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කර ඇත්තෙමු. |
| ජෙයපුරම් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 90 | 644 | සම්බන්ධතා ලබා දීමේ වැඩසටහන නුදුරු අනාගතයේදී ආරම්භ කෙරේ. |
| අයකච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 85 | 902 | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් සුළු ප්‍රමාදයක් ඇත. |
| තිරිමුරුක්කණ්ඩි නව ජල සම්පාදන යෝජනා ක්‍රමය (තුළමුව) | 100 | 57 | 847 | කොන්ත්‍රාත්තුව අවසන් කොට ඇත. |
| නෙළුම්වැව පුනුරුත්ථාපන ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 75 | 178 | බොහෝ දුරට නිම කර ඇත. |
| **පොදු සනීපාරක්ෂාව** | | | | |
| බදුල්ල දිස්ත්‍රික්කයේ මහජන සුවපහසු මධ්‍යස්ථානය ඉදිකිරීම සහ වැලිමඩ විජය මහා විද්‍යාලයේ (පාසල) සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම | 100 | 92 | 323 | මිල ඉහළ යාම, ද්‍රව්‍ය හිඟය සහ ද්‍රව්‍ය ප්‍රවාහන ගැටලුව ආදිය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වී ඇත. |
| **ආදිවාසී සනීපාරක්ෂාව** | | | | |
| මොනරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ ආදිවාසී වැසිකිළිය ඉදිකිරීම | 100 | 60 | 505 | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| **පාසල් සනීපාරක්ෂාව** | | | | |
| රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල, කිරගල පාසල්වල, සර්වෝදය පිරිවෙන, කොලොන්න සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම, ජේතවනාරාම වන සෙනසුන, නාකන්දල සහ සන්නස්ගම ප්‍රජා මූල සංවිධානයන්හි ජල සම්පාදන යෝජනා ක්‍රම | 100 | 65 | 201 | කොන්ත්‍රාත්තුව අවසන් කොට ඇත. |
| රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් / රෝහල් සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම | 100 | 60 | 247 | -එම- |
| මුලතිව් දිස්ත්‍රික්කයේ පාසල් සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම | 100 | 90 | 260 | මේ වන විට ඉදිකිරීම් 95% අවසන් කර ඇත. |
| කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් සනීපාරක්ෂාව ඉදිකිරීම - අදියර 01 | 100 | 35 | 197 | සනීපාරක්ෂක ද්‍රව්‍ය නොමැතිකම සහ ද්‍රව්‍ය ප්‍රවාහනයේ ගැටලු හේතුවෙන් අගෝස්තු මාසයෙන් පසු ඉදිකිරීම් මන්දගාමී විය. |

### 3.2 ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| රත්නපුර දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපන යෝජනා ක්‍රම සඳහා පීර්, යූපීවීසී, පයිප්ප සහ උපාංග සැපයීම සහ බෙදා හැරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට අත්තිකාරම් වශයෙන් රු. මිලියන 4.6ක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන විටත් සැපයීම ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. | පීර් පයිප්ප සහ උපාංගවල ද්‍රව්‍ය සපයනු ලැබේ. වෙළඳපොලේ ඇති ද්‍රව්‍ය හිඟය හේතුවෙන් යූපීවීසී පයිප්ප තවමත් සපයා නොමැත. | නියමිත කාල සීමාව තුළ කොන්ත්‍රාත්තු සම්පූර්ණ කිරීම සඳහා දිස්ත්‍රික් කළමනාකරුවන් සැපයුම් කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය අධීක්ෂණය කළ යුතු වීම. දුර්වල කාර්යසාධනයක් ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් කොන්ත්‍රාත් කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අඩු කළ යුතු වීම. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රු. මිලියන 343.46 ක සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකර වසර දෙකකට වඩා වැඩි කාලයක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගැනීමට ඉඩ හරිමින් ජල සම්පාදන ව්‍යාපෘති දහයක නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවන්ට මුල් කොන්ත්‍රාත් කාලයද ඉක්මවා යමින් එකම ව්‍යාපෘතිය සඳහා අවස්ථා දෙකේ සිට හත දක්වා කාල දිගුවන් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, ප්‍රජා විරෝධතා, ව්‍යාපෘති නිම කිරීමට වෙන් කර ඇති සීමිත කාලසීමාව, මාර්ග සංවර්ධන අධිකාරිය,ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය සහ දිස්ත්‍රික් ලේකම් වෙතින් අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය යනාදිය ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු විය. | ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් අධීක්ෂණය කළ යුතු වීම. |
| (ආ) | දැනට පවතින කොන්ත්‍රාත්වල දුර්වල කාර්යසාධනයක් ඇති කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකුට ලබා දී ඇති රු. මිලියන 140.65 ක අත්තිකාරමක් ව්‍යාපෘති කටයුතු සඳහා ඵලදායී ලෙස උපයෝජනය නොකිරීමට ඉඩ හැර කොන්ත්‍රාත්තු පහක් ප්‍රදානය කොට තිබුණි . | බුලත්කොහුපිටිය, ඔරුබැඳිවැව II සහ පොන්නගර් ජල සම්පාදන යෝජනා ක්‍රමවල අත්තිකාරම් ගෙවීම් ඉක්මනින් අය කර ගනු ඇත. තාණ්ඩුවන් ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයේ ප්‍රමාදයට හේතු වූයේ පොම්පාගාරවලට විදුලිය ලබා ගැනීම ප්‍රමාද වීම සහ විදුලි රැහැන් මාර්ගයේ ගස් කැපීමේ ගැටළු ය. | -එම- |
| (ඇ) | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පොන්නගර් පතිපුරම්හි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 216.93 ක පිරිවැයකට ප්‍රදානය කොට තිබූ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තොම්බර් 20 වන දින අවසන් කිරීමට නියමිතය. පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් වැඩවලින් සියයට 20 ක් පමණක් අවසන් කර තිබියදී කොන්ත්‍රාතාතුව අවසන් කර තිබුණි. තවද, ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත 2020 නොවැම්බර් 28 දින නිම කිරීමට නියමිතව 2019 නොවැම්බර් 15 ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වසර තුනකට වඩා වැඩි කාලයක් ප්‍රමාද වීමට හේතු වෙමින් 2022 මාර්තු 31 වන විටත් එය ජනසතු කොට නිවාස සම්බන්ධතා ලබා දී නොතිබුණි. | අද වන විට පවිත්‍රාගාරය ආරම්භ කර ඇති අතර සම්බන්ධතා ලබා දීමේ වැඩසටහන ආරම්භ කිරීමට නියමිතය. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මොණරාගල අපජල පවිත්‍රාගාර පිරියත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මාස 12ක කාලසීමාවකින් අවසන් කිරීමට නියමිතව 2020 ඔක්තෝම්බර් 20 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය නිම කර නොතිබූ අතර 2022 මාර්තු 31 වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 45 ක් පමණක්ව පැවතුණි. කෙසේ වෙතත්, අපේක්ෂිත නිම කිරීම් කාල සීමාවෙන් පසුව කොන්ත්‍රාත්කරුට කාල දිගුවක් ලබා දී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ලංසු තැබීමේ කාලය තුළ සේවාදායකයා වැඩබිම භාර දී තිබුණේ නැත. ප්‍රාදේශිය සභාව එම වැඩබිමට කුණු බැහැර කර ඇත. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ගේ විෂය පථය වෙනස් කරනු ලැබූ අතර ඔවුන්ට අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය. සාමූහික එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කොට ඇත්තෙමු. | -එම- |
| (ඉ) | ව්‍යාපෘතියේ ප්‍රථම කාල දිගුව 2022 මාර්තු 31 දින අවසන් වී තිබුණද, ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 15 වැනි වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් බදුල්ල දිස්ත්‍රික්කයේ අපජල පවිත්‍රාගාර පිරියත ඉදිකිරීමට කිසිදු කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කොට නොතිබුණි.තවද,එම වගන්තියට පටහැනිව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක නොවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට එක් ගලි බවුසරයක් නිදහස් කර තිබුණි. | සුදුසු ඉඩමක් සොයා ගන්නා ලද අතර අපජල පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. | -එම- |
| (ඊ) | නියැදි විගණන පරීක්ෂාවට අනුව, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.14 වගන්තියට පටහැනිව තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා සාරානුකූල ප්‍රතිචාර දක්වන ලංසුකරුවන් තෝරා ගැනීම වලක්වමින් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව, කුලියට වාහන ප්‍රසම්පාදනය කර ගැනීමේ කොන්ත්‍රාත්තු දෙතුන් වතාවක් දීර්ඝ කර තිබූ බව බව නිරීක්ෂණය විය. | වාහන සඳහා අලුත් ලංසු කැඳවීමට පියවර ගෙන ඇත්තෙමු. එම කොන්ත්‍රාත්තු නව කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙනු ලැබේ. | -එම- |
| (උ) | ව්‍යාපෘතියේ කාලසීමාව තුළ දිස්ත්‍රික්ක 07 තුළ ඉදිකිරීමට නියමිත වැසිකිලි සංඛ්‍යාව 24,000 ක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැසිකිළි 1,302 ක් හෙවත් සැලසුම් කර ඇති වැසිකිළිවලින් සියයට 34 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී ලබා දී ඇති සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක සහ අනෙකුත් කරුණු හේතුවෙන් ප්‍රතිලාභීන් වැඩසටහනින් ඉවත් කර අතහැර දමා ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුව ඒකක් රු.250,000ක් වන විශේෂ අවශ්‍යතා ඇති ප්‍රතිලාභී සනීපාරක්ෂක ඒකක 84 ක් කෑගල්ල, මොණරාගල හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි ඉදි කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ඒකක 43ක් හෙවත් සියයට 50ක් පමණක් කෑගල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල ඉදිකර තිබූ අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. තවද, බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල සැලසුම් කර තිබූ ආදිවාසී සනීපාරක්‍ෂක ඒකක 566ක් අතරින් ඒකක 154ක ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියරේදී තෝරා ගැනීමේ නිර්ණායක සහ අනෙකුත් කරුණු හේතුවෙන් කිලිනොච්චි වැඩසටහන තෝරා නොගත් අතර සුදුසුකම් ලත් ආදිවාසී ප්‍රතිලාභීන් 412ක් ව්‍යාපෘතිය තෝරාගෙන ඇත. | -එම- |
| (එ) | ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම් කටයුතු යන අංශවල උපදේශන සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා සඳහා රු. මිලියන 880.63 ක් හෙවත් සියයට 99 කට වැඩි මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සිදු කරන ලද නියැදි භෞතික විගණනයන්ට අනුව උපදේශන කොන්ත්‍රාත්තුව යටතේ බඳවා ගත් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්තුවල දුර්වල අධීක්ෂණය හා සුපරීක්ෂණය, අවශ්‍ය ව්‍යාපෘති කාල සීමාව අවිධිමත්ව හඳුනා ගැනීම, කොන්ත්‍රාත්තු දුර්වල ලෙස සැලසුම් කිරීම යනාදිය හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීම, ව්‍යාපෘති දිගු කිරීම්, විචල්‍ය නියෝග අනුමත කිරීම්, අමතර වැඩ අනුමත කිරීම්, නිල නිවාස ඉදිකිරීම් නැවත සැලසුම් කිරීම යනාදිය ව්‍යාපෘති කාල සීමාව තුල අඛණ්ඩව සිදු වූ බව නිරීක්ෂණය විය. | කාර්යසාධනය ඉහල නැංවීම සඳහා උපදේශකයින් සහ සේවාදායකයාගේ සහභාගීත්වය අවම වේ. එබැවින් එම සියලු ගැටළු සඳහා උපදේශකවරයා සම්පූර්ණයෙන්ම වගකිව යුතු නොවේ. | -එම- |

## 3.4 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | **යාලගමුව ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය**<br>**මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.** | | |
| (i) | වැලිපිටතැන්න සහ හෙලගම ජල සම්පාදන ව්‍යාපෘතීනට අදාලව ඉදිකරන ලද ජල ටැංකි නිසි පරිදි පිරිපහදු කර නොතිබූ අතර 2019 ඔක්තෝම්බර් 31 දිනෙන් පසුව ජල තත්ත්ව පරීක්‍ෂාවන් සිදු කර නොතිබුණි. එබැවින් ජනතාවට බෙදාහරින පානීය ජලයේ සුරක්ෂිතතාව සහතික කළ නොහැකි වේ. | වාතනය, රළු පෙරීම සහ වැලි පෙරීමේ ඒකකයන්හි ජල පිරිපහදු පහසුකම් ඉදිකර ඇති අතර ජලයේ ගුණාත්මකභාවය පානීය ජලයේ ප්‍රමිතියෙන් යුක්ත වේ. | පානීය ජලයේ ආරක්ෂිතභාවය සහතික කිරීම සඳහා වරින් වර ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කළ යුත වීම. |
| (ආ) | **උඩුබද්දන ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය**<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුබද්දන ප්‍රදේශයේ නිවාස 450කට පානීය ජලය සැපයීමේ අරමුණින් ඉදිකරන ලද ජල යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 98.6කට ප්‍රදානය කර තිබූ අතර 2019 පෙබරවාරි 13 වැනි දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, මහජන විරෝධතා, තුළමුව ඉදිකිරීමේ කටයුතුවලට එරෙහිව පවරා ඇති අධිකරණ නඩු හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. එබිවින් ව්‍යාපෘතියේ කටයුතු මාස 30කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. | ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් ප්‍රජාව විරෝධය පළ කළ අතර අවසානයේ එය අධිකරණයේ ගොනු කරන ලදී. එබැවින් ගිවිසුම සාමූහික එකඟතාවයෙන් අහෝසි කරන ලදී. මෙය කොන්ත්‍රාත්කරුගේ ප්‍රශ්නයක් නොවේ. | ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට පෙර ජල මූලාශ්‍ර හා ඉඩම් සම්බන්ධ සියලු ගැටළු නිරාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2018 දෙසැම්බර් 12 දිනට අවසන් කළ යුතුව තිබූ පහත සඳහන් ක්‍රියාකාරකම් 2021 දෙසැම්බර් අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.<br>• පයිප්ප සහ උපාංග එළීම<br>• ජල පොම්ප සැපයීම<br>• ජල ටැංකි ඉදිකිරීම<br>• භාරකාර නිල නිවාස ඉදිකිරීම<br>• | ප්‍රජාවගේ විරෝධය මත ඉදිකිරීම් කටයුතු කරගෙන යා නොහැක. | ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් අධීක්ෂණය කළ යුතු වීම. |
| (iii)) | 2018 දෙසැම්බර් 12 සිට 2019 නොවැම්බර් 27 දක්වා වූ තහනම් නියෝග කාල සීමාව තුළ උඩුබද්දන සිට ගම්පහ දක්වා බැකෝ කැණීම් යන්ත්‍රය ප්‍රවාහනය කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.77,760 ක මුදලක් 2019 පෙබරවාරි 05 දින ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව යන්ත්‍රෝපකරණ අක්‍රියව තැබීම් සහ ඉවත් කිරීමේ පිරිවැය ගෙවා ඇත. | සියලුම ගෙවීම් කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව සිදු කළ යුතු වීම. |
| (iv) | ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සඳහා තීන්දුව ලැබී මාස 11කට පසු 2017 නොවැම්බර් 27 දින එය අවසන් කරන ලදී. එබැවින් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය මත ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කිරීම ප්‍රමාද වීම නිසා, කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩබිම් ගබඩා කුලිය, සේවක වැටුප්, බැඳුම්කර දීර්ඝ කිරීමේ ගාස්තු සහ රක්ෂණය යනාදී වශයෙන් වියදම් දැරීම හේතුවෙන් රු.මිලියන 2.7 ක අලාභයක් සිදුව තිබුණි.තවද, කොන්ත්‍රාත්තුව අවසානයේදී රු.මිලියන 66.16 ක ඉතිරි වැඩ සිදුකිරීමට තිබූ අතර නව කොන්ත්‍රාත්තුව රු.මිලියන 104.41 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. එබැවින් මිල ඉහළ යාම ආදිය හේතුවෙන් ව්‍යාපෘතියට තවත් රු.මිලියන 38.25 ක අලාභයක් සිදුව තිබුණි. භෞතික ප්‍රගතිය සියයට 5 ක්ව පැවතියදී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසුව ඉතිරි වැඩ අවසන් කිරීමේ කොන්ත්‍රාත්තුව 2022 ජුලි 18 වන දින නිමකිරීමේ අපේක්ෂාවෙන් 2021 නොවැම්බර් 15 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, දෙවන කොන්ත්‍රාත්කරුගේද දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්රාත් කාලයෙන් | දැනටමත් දෙවන කොන්ත්‍රාත්කරු අඛණ්ඩ වැඩ සිදුකරගෙන යනු ලබන අතර ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ සහ ඉන්ධන හිඟය ද වැඩ ප්‍රගතියට බලපා ඇත. | ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් අධීක්ෂණය කළ යුතු වීම. |

සියයට 50ක් අවසන් වූ පසුවද 2022 මාර්තු මාසය අවසන් වන විටත් ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 25ක් ලෙස පැවතියේ ව්‍යාපෘතියේ අරමුණු නිසිවේලාවට සාක්ෂාත් කර ගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයක් ඇති කරමිනි.

(ඇ) **දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | බදුල්ල දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 337.44 ක පිරිවැයකට 2018 මැයි 23 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළ අවසන් කිරීමට නියමිත විය. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් තුන් වරක් කාල දිගුවන් ලබා දීමෙන් පසු ව්‍යාපෘති ප්‍රගතිය සියයට 31ක්ව තිබියදී 2022 ජනවාරි 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමේ කොන්ත්‍රාත්තුව 2022 මැයි මාසය අවසන් වන විටත් ප්‍රදානය කර නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත්තුව නියමිත වේලාවට අවසන් කිරීමේ තීරණය නිවැරදි වේලාවට ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 4ක් ගතවූ පසුවද ව්‍යාපෘතියේ අවසාන අරමුණු ඉටු කර ගැනීමට නොහැකිව පැවති අතර 2019 මැයි 06 දින ගෙවා ඇති රු.මිලියන 57.65 ක අත්තිකාරම් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ඵලදායී ලෙස භාවිතා නොකර තබා ගැනීමට ඉඩ හැර තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් කර ඇති අතර කාර්ය සාධන සුරක්ෂණය සහ අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණය අහිමි කොට ඇත. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති අවසන් කිරීම සඳහා දිස්ත්‍රික් කළමනාකරුවන් ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කළ යුතු වීම. |
| (ii) | 2017 නොවැම්බර් 08 වැනි දින පල කරන ලද පුවත් දැන්වීමට අනුව, කොන්ත්‍රාත්කරු සීඅයිඩීඒ හි ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයේ සී2 හෝ ඊට ඉහල ශ්‍රේණියේ ලියාපදිංචි විය යුතු වේ. කෙසේ වෙතත්, 2014 ජූලි මස ප්‍රකාශයට පත් කරන ලද සංශෝධිත ලෝක බැංකු ප්‍රසම්පාදන | ලංසු තැබීමේදී කොන්ත්‍රාත්කරු ජල සැපයුමේ සීඅයිඩීඒ හි සී2 සම්පූර්ණ කර තිබුණි. | සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරුවන්ට පමණක් කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි ජල සම්පාදන හා සනීපාරක්ෂාව යන ක්ෂේත්‍රවල පූර්ව පළපුරුද්දක් නොමැතිව ඉහත කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන අනුව, ඩීඅයි සහ පීවී පයිප්ප සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් විසින් පූර්ව කර්මාන්තශාලා වාරක පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | |
| (iii)) | ව්‍යාපෘතිය ආරම්භ කර මාස 42 ක් ගත වන විටත් 2021 නොවැම්බර් 29 වන දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයට අනුව කිලෝමීටර 24 න් කිලෝ මීටර් 1.5 ක බෙදා හැරීමේ නල එලීම අවසන් කර තිබුණි.තවද, ව්‍යාපෘතියට අවශ්‍ය නල සැපයීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ජල සම්පාදන මණ්ඩලයේ නල සහ උපාංග ඉල්ලීම් කොට කොන්ත්‍රාත්කරුට භාර දී තිබුණි. කෙසේවෙතත්,එසේ සපයා තිබූ ඩීඅයි බට මීටර් 2123 කින් මීටර් 1942.6 ක් පමණක් කොන්ත්‍රාත්කරු විසින් එළා තිබුණි.කෙසේ වෙතත්, 2022 මාර්තු 31 වන දින වන විටත් එම නල නැවත ජල සම්පාදන මණ්ඩලයට ලබා දීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මණ්ඩලයට ඩීඅයි පයිප්ප සැපයීම සඳහා මණ්ඩලය විසින් නව සැපයුම් කොන්ත්‍රාත්තුවක් සකස් කර වසිප් අරමුදල් යටතේ ප්‍රදානය කර ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු වීම. |
| (iv) | කොන්ත්‍රාත්කරු විසින් තාවකාලික මාර්ග පුනස්ථාපනයන් නිසියාකාරව නිම කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මාර්ගයේ අතුරා තිබූ ඒබීසී ගැලවී බණ්ඩාරවෙල - දියතලාව ප්‍රධාන මාර්ගයට හානි වී ඇති බව නිරීක්ෂණය විය. එහෙත් එය නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයිපීසී -04 බිල්පතෙන් කොන්ත්‍රාත්කරුගෙන් රු. 2,758,945.00 ක මුදලක් අඩු කර ගෙන ඇත. | මාර්ග හානි කඩිනමින් නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |

(ඇ) **ඔරුබැදිවැව ජල සම්පාදන ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ඔරුබැදිවැව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු 2021 ඔක්තෝම්බර් 14 දින අවසන් කිරීමේ අපේක්ෂාවෙන් රු. මිලියන 428.91 ක පිරිවැයකට 2020 ඔක්තෝබර් 15 වන දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 මාර්තු මාසය අවසන් වන විටත් ව්‍යාපෘති කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව පැවති අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 55ක් පමණක්ව පැවතුණි. | කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය කොවිඩ් - 19 බලපෑමට හසුවිය. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති අවසන් කිරීම සඳහා දිස්ත්‍රික් කළමනාකරුවන් ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කළ යුතු වීම. |
| (ii) | තුළුමුව සිට මහියංගනය ගිරාඳුරුකෝට්ටේ මාර්ගය දක්වා නල එළීම 2022 ජනවාරි මස අවසානය වන විටත් නිම කර නොතිබුණි. | මහියංගනය - ගිරාදුරුකෝට්ටේ මාර්ගයේ නල එළීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇත. | කාර්යයන් නියමිත වේලාවට කොන්ත්‍රාත්කරු ලවා ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iii)) | මෙම ව්‍යාපෘතියට මෙන්ම පුරානැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද බතලයාය, බෙලගන්වැව ජල ව්‍යාපෘති සඳහාද එක් තුළුමුවක් ඉදිකිරීමට ඇතිකර ගත් වාචික එකඟතාව මත ප්‍රමාණ පත්‍ර අංක 08 හි අයිතම අංක 01 තුල ඇතුලත් කර තිබූ රු. මිලියන 13.5 ක පාවෙන තුළුමුව ඉදිකිරීම ඉවත් කර තිබුණද. ඒ සඳහා ගෙවා ඇති රු.මිලියන 2.7 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි. | තුළුමුව ඉදිකිරීමේ පිරිවැය ඉතිරිය සැලකිල්ලට ගන්නා ලදී. | වැඩිපුර ගෙවූ අත්තිකාරම් කඩිනමින් ආපසු අයකර ගැනීම සහතික විය යුතු වීම. |
| (iv) | කාණ්ඩ 6ක වෙනස් දුර ප්‍රමාණයන්ට අදාලව පීඊ සහ යූපීවීසී නල මීටර් 2958ක එළීම් කටයුතු 2022 ජනවාරි මස අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද, මහවැලි අධිකාරී පරිශ්‍රය හරහා බෙදාහැරීමේ නල එළීම සඳහා 2022 මාර්තු අවසානය වන විටත් මහවැලි අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මීටර් 2958 ක පීඊ සහ යූපීවීසී නල එළීම බොහෝ දුරට අවසන් කර ඇත. | නල එළීමේ කටයුතු සඳහා අදාළ ආයතනවලින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වීම. |

## 3.5 නිෂ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වාහන දෙකක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහ වැවිලි මානව සංවර්ධන භාරයට මුදා හැර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 3.94ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මුදා හරින ලද වාහනය ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 33 සහ 34 වගන්තිවලට පටහැනිව දෛනික කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා යොදාගෙන තිබූ බව විගණනයේදී අනාවරණය විය. | ව්‍යාපෘතිය සඳහා අපජල පවිත්‍රාගාර නිර්මාණය හා සැලසුම් කිරීම සමග සම්බන්ධ වන බැවින් දැනට අප විසින් ජලසම්පාදන මණ්ඩලයේ මලාපවහන අංශය සඳහා වාහනයක් වෙන් කර ඇත. | ඒ ඒ ආයතනවලින් වාහන ලබා ගැනීමට පසු විපරම් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂය තුළ රු.මිලියන 27.2 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර ගත් ජංගම විද්‍යාගාරයක්, වාහනයේ නීත්‍යානුකූල අයිතිය නිසි පරිදි පැවරීමකින් තොරව 2019 අප්‍රේල් 10 වන දින ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට දින භාර දී තිබුණි. කෙසේ වෙතත්, එය සාම්පල එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට දින 24 ක් සඳහා පමණක් භාවිතා කර තිබුණි. | ජංගම රසායනාගාර අයිතිය 2019.04.10 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී. ඉන් පසුව රසායනාගාරය දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ සඳහා භාවිතා කරන ලදී. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 03 වන සංරචකයේ ඇතුලත් ආශ්‍රිත ආයතන විසින් ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායී ලෙස භාවිතා කරන බවට සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු වීම. |
| (ඇ) | ප්‍රජා මූල ජල ව්‍යාපෘති සඳහා බෙදා හැරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාසවලදී රු. මිලියන 90.98 ක් වටිනා ජල මීටර සහ ෆෙරුල 15,000 බැගින් ප්‍රසම්පාදනය කොට ගෙන තිබුණි.කෙසේ වෙතත්, ඉන් රු.මිලියන 41.95 ක් වටිනා ජල මනු 3100 ක සංඛ්‍යාවක් සහ ෆෙරුල් 13282 ක සංඛ්‍යාවක් දිස්ත්‍රික් කළමණාකාර කාර්යාල වෙත බෙදා හැරීමකින් තොරව 2022 මැයි 18 වන දින වන විටත් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ පැවතුනි. කෙසේ වෙතත්, එක් එක් දිස්ත්‍රික්කවල නව ජල සම්බන්ධතා සඳහා දැනටමත් භාවිත කරන ලද ජල මනු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට නොලැබුණි. | අනාගත නිවාස සම්බන්ධතා සඳහා එම ද්‍රව්‍ය අවශ්‍ය වේ. | ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු වීම. |

**3.6 මතභේදාත්මක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ පරිගණක සහ කාර්යාල උපකරණ ඇතුළු ස්ථාවර වත්කම් අයිතම 125ක් ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නිදහස් කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. | ව්‍යාපෘතියේ 3 වන සංරචකයේ කොන්දේසි අනුව මණ්ඩලයේ, වතු නිවාස සංවර්ධන භාරයේ සහ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හඳුනාගෙන සපයා ඇත. | ව්‍යාපෘතියේ 3 වන සංරචකයේ කොන්දේසි අනුව හඳුනාගත් පාර්ශ්වකරුවන් වෙත ව්‍යාපෘතියේ වත්කම් මුදා හැරීමේදී ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වීම. |

**3.7 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය තනතුරු 27 කින් සමන්විත විය. ඒ අතරින් තනතුරු 18 කට අයත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කලමණාකරුවන්, ඉංජිනේරුවරුන්, ප්‍රධාන ගණකාධිකාරී සහ සමාජවිද්‍යාඥ යනාදී ප්‍රධාන තනතුරු ඇතුළත්ව පුරප්පාඩු 81ක් 2021 දෙසැම්බර් 31 දිනට වසර 06 කට වඩා වැඩි කාලයක් සම්පූර්ණ කිරීමකින් තොරව පැවතුණි. තවද, ආයතනික සහ සන්නිවේදන විශේෂඥ, වැඩසටහන් නිලධාරී, පරිපාලන නිලධාරි සහ ව්‍යාපෘති ලේකම් යන අනුමත තනතුරු සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කිසිදු නිලධාරියකු බඳවා ගෙන නොතිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සේවකයින්ට කිසිදු රාජකාරී ලැයිස්තුවක් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය. | සියලුම පුරප්පාඩු වැඩ අවශ්‍යතා අනුව පුරවා ඇති අතර සමාජ විද්‍යාඥ සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ යන තනතුරු වල පුරප්පාඩු සමහරක් පමණක් වසර 6කට වැඩි කාලයක් පුරවා නොමැත. | පුරප්පාඩු ප්‍රමාදයකින් තොරව පිරවීමටත් අනුමත නොකළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් වැළකීමටත් කටයුතු කළ යුතු වීම. තවද, සෑම එකිනෙක සේවකයකු සඳහාම රාජකාරි ලැයිස්තුන් ලබා දිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව සේවා කොන්ත්‍රාත් ගිවිසුම් පදනම යටතේ සේවකයින් 133 දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබූ අතර එකතු වටිනාකම රු. මිලියන 69.20 ක වේතනයක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. ඒ අතරින් සේවකයින් 29 දෙනෙකු ප්‍රමාණ සමීක්ෂක, කෙටුම්පත් ශිල්පී සහ ඉඩම් නිලධාරී යන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු 08 ක් සඳහා සේවයේ යොදවා තිබුණි. | බඳවා ගැනීමට පෙර පරිත්‍යාගශීලීන්(ණය නියෝජිතයන්) දැනුවත් කර ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීමට අපට හැකි විය. මෙම තනතුරු සියල්ලම කෙටි කාලීන ගිවිසුම් බැවින් අප කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා නොගත්තෙමු. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල විධිවිධාන සමග දැඩිව අනුගත විය යුතු වීම. |
| (ඇ) | අංක 01/2019 දරන හා 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව කාර්යක්ෂම ව්‍යාපෘති කලමණාකරනයක් සහතික කිරීම සඳහා සෑම විටම ව්‍යාපෘති අධ්‍යක්ෂ පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතු වුවද ව්‍යාපෘති අධ්‍යක්ෂ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 නොවැම්බර් 05 දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුර) ලෙස උසස් කර තිබුණි. | ඔහු ව්‍යාපෘතිය පිළිබඳ මනා දැනුමක් ඇති බැවින් හා ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කිරීමේ අවසන් අදියරේ පවතින බැවින් නව බඳවා ගැනීම් අවශ්‍ය නොවන අතර ඉදිරියේදී ද ඔහුට අඛණ්ඩව වැඩ කරගෙන යාමට හැකි වනු ඇත. | පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට කටයුතු කළ යුතු වීම. |